නෙළුව ප්‍රාදේශීය සභාව

ගාල්ල දිස්ත්‍රික්කය

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2014 අප්‍රේල් 07 දිනද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 දෙසැම්බර් 22 දින සභාවේ සභාපතිවරයාට යවා ඇත.

**1.2 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට නෙළුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.3.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම්**

2010 ජනවාරි 19 දිනැති අංක PED/54 දරන රාජ්‍ය ව්‍යාපාර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ චක්‍රලේඛය අනුව 2011 ජනවාරි 01 දින සිට පළාත් පාලන ආයතන විසින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කළයුතු වුවත් එම ප්‍රමිති අනුගමනය කර නොතිබුණි.

**1.3.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති**

සභාව විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති මූල්‍ය ප්‍රකාශන සමඟ හෙළිදරව් කර නොතිබුණි.

**1.3.3 ගිණුම්කරණ අඩුපාඩු**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වර්ෂ 05 කට පෙර සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.104,338 ක් වූ හඳුනා නොගත් ආදායම් ශේෂයක් බැරකම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ආ) ඉකුත් වර්ෂයට අදාල කර්මාන්ත 06 ක් සඳහා ගෙවන ලද රු.1,203,287 ක් සමාලෝචිත වර්ෂයේ වියදම් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් රු.1,203,287 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ඉකුත් වර්ෂයේ දී ණයහිමි ප්‍රතිපාදන සලසා නොතිබූ කර්මාන්ත දෙකක් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ණයහිමියන් යටතේ රු.572,547 ක් ගෙවීම් කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ණයහිමියන් රු.572,547 කින් අඩුවෙන් ද, සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය එම ප්‍රමාණයෙන් වැඩියෙන් ද දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල කර්මාන්ත 12 ක් සඳහා රු.7,475,775 ක් වූ ලැබිය යුතු මූලධන ආධාර හා ගෙවිය යුතු වියදම් සඳහා මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදන සලසා නොතිබීමෙන් සමාලෝචිත වර්ෂයේ ආදායම් හා වියදම් රු.7,475,775 කින් හා ණයගැතියන් හා ණයහිමියන් එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඉ) ඉකුත් වර්ෂයට අදාල කර්මාන්තයක් වූ යක්කඩුව පාර මීටර් 04 ක් පළලට කපා මට්ටම් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුලදී රු.96,869 ක් ණයහිමියන් යටතේ ගෙවීම් කර තිබුණ ද, රු.78,693 ක් නැවත වරක් වැය ශීර්ෂයට හර කර තිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල සමාලෝචිත වර්ෂයේ ප්‍රාග්ධන වියදම් රු.78,693 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය තුලදී මිලදී ගෙන තිබූ රු.46,950 ක් වූ යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ, රු.1,532,200 ක් වූ ලී බඩු හා සවිකිරීම් හා රු.17,500 ක ගොඩනැගිලි ඉදිකිරීමේ වියදම් ද වශයෙන් එකතුව රු.1,596,650 ක ස්ථාවර වත්කම් ප්‍රාග්ධනිත කර නොතිබීමෙන් මූල්‍ය ප්‍රකාශනවල ස්ථාවර වත්කම් හා ප්‍රාග්ධන යෙදුමට ආදායමින් දායක වීම් ගිණුමේ ශේෂය රු.1,596,650 කින් අඩුවෙන් දක්වා තිබුණි.

### 1.3.4 නොසැසඳු පාලන ගිණුම්

---------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශන අනුව පෙර ගෙවුම් ශේෂය රු.423,125 ක් වූ අතර උපයෝගී ලේඛන අනුව එම ශේෂය රු.1,435,625 ක් වූයෙන් රු.1,012,500 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) ගිණුම් විෂයයන් 07 කට අදාල රු.1,443,435 ක් වූ පාලන ගිණුම් ශේෂයන්, ඊට අදාල උපයෝගී ලේඛන තුලනය කර නොතිබීමෙන්, පාලන ගිණුම්වල ශේෂ උපයෝගී ලේඛනවල ශේෂ සමග සැසඳිය නොහැකි විය.

### 1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

------------------------------------

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ එකතුව රු.57,430,080 ක් වූ ගනුදෙනු සම්බන්ධව හිමිකම් ඔප්පු, යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය, සමීක්ෂණ මණ්ඩල වාර්තා, තුලනය කරන ලද තැන්පත් ලේඛනය, උපලේඛන හා කාල විශ්ලේෂණ පිළිබඳ සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

-----------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.613,519 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,435,943 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

### 2.2.1 අක්කර බදු හා බදුකුලී

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.6,222 ක අක්කර බදු සහ රු.9,480,197 ක් වූ බදු කුලී හිඟව පැවතිය ද, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 සහ 159 වගන්ති ප්‍රකාරව හිඟ ශේෂයන් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2013 දෙසැම්බර් 31 දිනට රු. 108,917 ක උසාවි දඩ හා රු. 1,217,860 ක් වූ මුද්දර ගාස්තු ලැබිය යුතුව තිබුණි.

### 2.2.3 එක්වන් මුදල් අයකර නොගැනීම

2009 වර්ෂයේ දී නෙළුව පොළ භූමියේ පිහිටි කඩ කුටි 258 ක් වෙළෙඳුන්ට ලබා දීමේ දී එක් කුටියකින් රු.10,000 ක එක්වන් මුදලක් ද, කඩ අල්ලි 142 කින් එක කඩ අල්ලියක් සඳහා රු.5,000 ක එක්වන් මුදලක් ද අය කිරීමේ පදනම මත එකී කුටි සහ කඩ අල්ලි වෙළෙඳුන් වෙත ලබා දී තිබුණි.

මේ සම්බන්ධයෙන් 2014 ඔක්තෝබර් 02 දින සිදුකල විගණන පරීක්ෂාවේ දී පොල කඩ කුටිවලින් අයවිය යුතු එක්වන් මුදලින් රු.2,285,000 ක් සහ පොල කඩ අල්ලිවලින් අයවිය යුතු එක්වන් මුදල් රු.525,000 ක් ද වශයෙන් එකතුව රු.2,810,000 ක් අයකර ගෙන නොතිබු බව නිරික්ෂණය විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

1988 අංක 74 දරන පනතින් සංශෝධිත 1975 අංක 01 දරන වත්කම් හා බැරකම් ප්‍රකාශ කිරීමේ පනතේ අවශ්‍යතාවයන් අනුව සභාවේ මන්ත්‍රීවරුන් 06 දෙනෙකු විසින් 2013 වර්ෂය සඳහා වූ වත්කම් හා බැරකම් ප්‍රකාශ විගණන දිනය වූ 2014 ඔක්තෝබර් 05 දින දක්වා ලබා දී නොතිබුණි.

### 3.2 නෙළුව පොදු වෙළඳපොල කඩ කාමර බදු

නෙළුව නව දෙමහල් පොදු වෙළඳපොල බිම් මහලේ කඩ කාමර 19 ක් ද, පළමු මහලේ කඩ කාමර 24 ක් ද ඇතුළුව කඩ කාමර 43 ක් 2011 ජනවාරි 01 දින ගිවිසුම් අත්සන් කර බදු දී තිබුණි.

මේ සම්බන්ධයෙන් 2014 ඔක්තෝබර් 04 දින සිදුකල ස්ථානීය පරීක්ෂාවේ දී පහත කරුණු නිරීක්ෂණය විය.

(i) ගිවිසුමේ 06 වන කොන්දේසිය අනුව ගිවිසුම්ගත වෙළඳාම හැර වෙනත් වෙළඳාමක් කඩ කාමරයේ පවත්වාගෙන යාමට අවසර නොතිබුණ ද කඩ කාමර 08 ක් වෙනත් වෙළඳාම් සඳහා යොදා ගෙන තිබුණි.

(ii) ගිවිසුමේ 07 වන කොන්දේසිය අනුව බදු ගැණුම්කරු විසින් එකී කඩ කාමරය හෝ එහි යම් කොටසක් භුක්තිය වෙනත් අයෙකුට විකිණීම හෝ පැවරීම හෝ අතුරු බදුදීමට හෝ ප්‍රාදේශීය සභාවේ අවසරයක් නොමැතිව තෙවැනි පාර්ශවය සමග එකඟතාවයකට එළඹිය නොහැකි බව දක්වා ඇතත්, කඩ කාමර 05 ක් අතුරු බදු දී තිබුණි.

(iii) ගිවිසුමේ 13 වන කොන්දේසිය අනුව මාස තුන හෝ ඊට වැඩි කාලයකට බදු කුලී ගෙවීම අතපසු කරන විට හිඟ බදුකුලී අය කරගෙන බදු ගැණුම්කාර පක්ෂය කඩ කාමරයෙන් නෙරපා හැරීමට යටත්වීමට බදු ගැණුම්කාර පක්ෂය එකඟ වේ යන්න දක්වා ඇතත්, එසේ මාස 03 කට වඩා බදුකුලී නොගෙවූ කඩ කාමර 05 ක බදු ගැනුම්කරුවන් සම්බන්ධයෙන් එපරිදි කටයුතු කර නොතිබුණි.

(iv) ගිවිසුමේ 17 වන කොන්දේසිය අනුව සභාපතිතුමාගේ ලිඛිත අවසරයකින් තොරව බද්දට යටත් දේපලෙහි කිසිදු වෙනසක් නොකිරීමට බදු ගැණුම්කරු එකඟ වී තිබුණ ද බිම් මහලේ අංක 02, 05 සහ 06 ද, පළමු මහලේ අංක 21 සහ 22 කඩ කාමර ලෑලි අසුරා වෙනස් කිරීම් කර තිබුණි.

(v) ගිවිසුමේ 20 කොන්දේසිය අනුව කඩ කාමරවලට පිවිසීමට ඇති ප්‍රවේශ මාර්ග හා කඩ කාමරයෙන් පිටත වෙළඳ බඩු නොතැබිය යුතුය යන්න දක්වා ඇතත්, බිම් මහලේ කඩ කාමර අංක 14 හා පළමු මහලේ පිවිසුම් මාර්ගය හා කඩ කාමර ඉදිරි පිට ප්‍රදර්ශනය සඳහා භාණ්ඩ අසුරා තිබුණි.

(vi) ගිවිසුමේ 21 වන කොන්දේසිය අනුව කඩ කාමරය බඩු ගබඩාවක් සේ පාවිච්චි නොකළ යුතු වුවද බිම් මහලේ කඩ කාමර අංක 03 හි විදුලි උපකරණ ගබඩා කර තිබුණි.

(vii) සභාව කඩ කාමර බදු දී ඇත්තේ මහජනතාවගේ යහපත සඳහා ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා වුවත්, බිම් මහලේ කඩ කාමර අංක 01, 03, 09 සහ පළමු මහලේ අංක 01, 02, 03 යන කඩ කාමර වසා තිබුණි.

### 3.3 මූල්‍ය පාලන දුර්වලතා

----------------------

සභාවට අයත් බැංකු ජංගම ගිණුමෙහි වර්ෂ 03 කට පෙර සිට මුදල් පොතේ ශේෂය හා බැංකු ප්‍රකාශනයේ ශේෂය අතර රු.19,218 ක වෙනසක් පැවතිය ද, එකී වෙනස හඳුනාගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

### 3.4 මතභේදයට තුඩුදුන් ගනුදෙනු

--------------------------------

සුබ සාධක සමිති 2ක් හා ගොවි සමිතියක් විසින් භාණ්ඩ හා උපකරණ ලබාදීමට කටයුතු කරන ලෙස කරන ලද ඉල්ලීම් අනුව මිල ගණන් කැඳවා ප්ලාස්ටික් පුටු ලබාදීමට 2013 මැයි 28 දින සභා තීරණය අනුව සභාව විසින් කටයුතු කර තිබුණි. ඒ අනුව 2013 ජුනි 17 දින වවුචර් අංක 350 මඟින් රු.200,000 ක් ගෙවා ඇඳි සහිත පුටු 290 ක් පෞද්ගලික ආයතනයකින් මිලදී ගෙන තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(අ) පුටු මිලදී ගැනීම සඳහා ටෙන්ඩර් මණ්ඩල තීරණයක් ගෙන නොතිබූ අතර, ආයතන තුනකින් මිල ගණන් ලබාගෙන මිලදී ගැනීම් කර තිබුණි.

(ආ) පුටු මිලදී ගනු ආයතනය විසින් නිකුත් කල බිල් පතෙහි දිනය වෙනස් කර තිබුණි.

(ඇ) මිලදී ගත් පුටු සභාවේ තොග පොතක හෝ ඉන්වෙන්ට්‍රි ලේඛනයේ සටහන් කර නොතිබු අතර පුටු බෙදාහැරීම් පිළිබඳ විස්තර ඇතුලත් ලේඛන විගණනයට ඉදිරිපත් නොවුණි.

(ඈ) එක් සුභ සාධක සමිතියක් විසින් ප්ලාස්ටික් පුටු ලබාදීම වෙනුවෙන් ස්තුති කර සභාපතිවරයා වෙත 2013 ජුනි 27 දින ඉදිරිපත් කර තිබූ ලිපියක් වවුචරයට අමුණා තිබුණ ද, එලෙස ප්ලාස්ටික් පුටු ලබාදීමක් සිදුකර නොමැති බව එම සමිතියේ සභාපති හා උප ලේකම් විසින් 2014 ඔක්තෝබර් 01 දින විගණනය වෙත ලිඛිතව තහවුරු කරන ලදි.

(ඉ) පුටු 100 ක් ලබා දෙන ලෙස ඉල්ලුම් කලද, 2014 ඔක්තෝබර් 01 දින දක්වා පුටු ලබා දී නොමැති බව අනෙක් සුභසාධන සමිතියේ ලේකම්වරයා විසින් ද විගණනය වෙත ලිඛිත ප්‍රකාශයක් මගින් සනාථ කරන ලදි.

(ඊ) 2013 මැයි 15 දින ගොවි සමිතියේ ලේකම්වරයා විසින් පුටු ලබාදෙන ලෙස සභාවෙන් ඉල්ලීමක් කල බව දක්වා තිබුණ ද, සමිතියේ ලේකම් වශයෙන් තමා ප්‍රාදේශීය සභාවෙන් පුටු ලබාදෙන ලෙස ඉල්ලීමක් නොකල බවත්, මෙම සමිතිය ගොවි සංවිධානයක් බවත්, එයින් සිදු කරනුයේ කෘෂිකාර්මික කටයුතුවල දියුණුව සඳහා වන කටයුතු පමණක් බවත් උත්සව අවස්ථාවන් සඳහා පුටු හා මඩු සැපයීම සමිතියේ කාර්යයක් නොවන බවත්, ඒ අනුව සමිතියට පුටු ලබා ගැනීමට අවශ්‍යතාවයක් නොවන බවත්, ගොවි සමිතියේ ලේකම්වරයා විසින් 2014 ඔක්තෝබර් 01 දින ලිඛිතව දන්වා තිබුණි. මීට අමතරව 2013 හෝ 2014 වර්ෂයේදි ප්‍රාදේශිය සභාව විසින් සමිතියට පුටු ලබා දී නොමැති බවත් එහි සඳහන් කර තිබුණි.

**3.5 නිශ්ක්‍රීය වත්කම්**

-------------------

රු.250,000 ක් වටිනාකම වූ අත් ට්‍රැක්ටරයක් පළාත් පාලන සහ පළාත් සභා අමාත්‍යාංශය විසින් 2008 ජනවාරි 11 දින සභාවට පරිත්‍යාග ලෙස ලබා දී තිබුණි. 2014 ඔක්තෝබර් 01 දින සිදු කරන ලද ස්ථානීය පරීක්ෂාවේ දී මෙම රථය ධාවනයෙන් තොරව සහා භූමියේ ගාල්කර තිබූ බවත්, ධාවන තත්ත්වයෙන් තොරවීම නිසා ටයර් භාවිතයට ගත නොහැකි තත්ත්වයට පත්ව තිබූ බවත් නිරීක්ෂණය විය.

**5. පද්ධති හා පාලන**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය